# කොළඹ විශ්ව විද්‍යාලය

## කලා පීඨය

## කලා අංශයේ තෙවන වසර විභාගය- 2021/2022

## පළමු වාරයේ අවසානය

## ENH: 3148 (දරිද්‍රතාවය සහ සමාජ ඒකාබද්ධතාවය)

## අවසර ලත් වේලාව: පැය දෙකකි (02)

## ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

---

**ප්‍රශ්න අංක 01**

I. ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 05)

II. සුදුසු උදාහරණ භාවිතා කරමින් සාපේක්ෂ දරිද්‍රතාවය පිළිබඳ සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 08)

III. "දරිද්‍රතාවයට ඇති හැකියා ප්‍රවේශය අනෙකුත් ප්‍රවේශයන්ට වඩා දරිද්‍රතාවය අවබෝධ කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනයේදී ප්‍රයෝජනවත් වේ." සාකච්ඡා කරන්න. (ලකුණු 12)

**ප්‍රශ්න අංක 02**

I. දරිද්‍රතාවයට බලපාන සාධක සාකච්ඡා කරන්න? (ලකුණු 05)

II. ප්‍රමාණවත් තොරතුරු නොමැතිකම (Inadequate Information) රටක දරිද්‍රතාවය වැඩි වීමට හේතු වන්නේ කෙසේද? (ලකුණු 10)

III. ශ්‍රී ලංකාවට බලපාන වත්මන් ආර්ථික අර්බුදය මගින් අවදානමට ලක්විය හැකි ජනතාව (Vulnerable People) දරිද්‍රතාවයට තල්ලු කර ඇත. පැහැදිලි කරන්න. (ලකුණු 10)

**ප්‍රශ්න අංක 03**

I. "සමාජ බහිෂ්කරණය සමාජයේ ඉහළ දරිද්‍රතා මට්ටම් ඇති කිරීමට මූලික වශයෙන් දායක වන සාධකයකි". මෙම ප්‍රකාශය ශ්‍රී ලාංකේය සමාජයෙන් උදාහරණ ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. සමාජ ඒකාබද්ධතාවය තුලින් රටක ජීවත්වන ජනතාවගේ සමාජ යහපැවැත්ම වැඩිදියුණු කළ හැක්කේ කෙසේද? ඔබේ සමාජයෙන් උදාහරණ භාවිතා කරමින් පිළිතුර සාකච්ඡා කරන්න. (ලකුණු 07)

III. රටක දිළිඳුකම වැළැක්වීම සඳහා කාන්තා සවිබල ගැන්වීම ප්‍රධාන පියවරක් වන්නේ ඇයි? ශ්‍රී ලාංකේය සමාජ පසුබිමට අදාළව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

**ප්‍රශ්න අංක 04**

I. අන්තර්ගෘහිත සමාජයක් (Inclusive Society)ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන පියවරයන් විස්තර කරන්න. (ලකුණු 05)

II. දරිද්‍රතාවය වැලැක්වීම සඳහා ශ්‍රී ලාංකේය සමාජයේ ආන්තිකරණයට (Marginalized) ලක්වූ සමාජ කණ්ඩායම්වල අවශ්‍යතා හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද? ඔබේ පිළිතුර විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

III. අන්තර්ගෘහිත සමාජයක් නිර්මාණය කිරීමේදී රජයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග සහ ඒවායේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 10)

**ප්‍රශ්න අංක 05**

I. ඔබ සංවර්ධනය (Development) සහ තිරසාර සංවර්ධනය (Sustainable Development) අතර වෙනස හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 06)

II. " රටක සංවර්ධනය වෙළඳපොළ ක්‍රියාකාරකම් තුලින් සිදු වේ" මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

III. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන තිරසාර ගැටළු සාකච්ඡා කරන්න. (ලකුණු 09)

**ප්‍රශ්න අංක 06**

I. තිරසාර සංවර්ධනයේ අරමුණු සාකච්ඡා කරන්න? (ලකුණු 08)

II. තිරසාර සංවර්ධනයේ අරමුණු තුලනය විය යුතු ආකාරය ප්‍රතිපත්තිමය දෘෂ්ටිකෝණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. Covid-19 වසංගතය තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට බලපෑවේ කෙසේද? (ලකුණු 09)

**ප්‍රශ්න අංක 07**

පහත ඕනෑම පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

I. කාන්තා දරිද්‍රතාවය

ii. ගිනි සංගුණකය

iii. සමෘද්ධි වැඩසටහන

iv. සමාජ ප්‍රාග්ධනය

v. දරිද්‍රතා පරතරය

vi. දරිද්‍රතාවය හඳුනා ගැනීම සඳහා වන මූල්‍ය ප්‍රවේශය

vii. දරිද්‍රතාවය බහුමානීය සංකල්පයක් වේ.

viii. රොස්ටෝව්ගේ වර්ධනයේ අදියර පහ

(එක් කොටසකට ලකුණු 05)